# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 45 දරන
# ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍යසභා ආඥා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ඔක්තෝබර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 20 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1983 අංක 45 දරන ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 37/83

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 45 දරන ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 28 වන වගන්තිය, ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **381 වන අධිකාරයේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(4අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 161 වන ව්‍යවස්ථාවේ, (ඈ) ඡේදයේ (iii) වන අනුඡේදයේ විධිවිධාන යටතේ පවත්වනු ලබන මැතිවරණයක අපේක්ෂකයකුගේ සෑම නාමයෝජනා පත්‍රයකට ම, අපේක්ෂකයා විසින් අවස්ථාවෝචිත පරිදි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතිය අනුව දිවුරුම් දී අත්සන් කරන ලද හෝ ප්‍රතිඥා දී අත්සන් කරන ලද දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් අමුණා තිබිය යුතු ය.

ඒ මැතිවරණයේ සෑම තේරීම් භාර නිලධරයකු විසින් ම, මේ උපවගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට අනුකූල නොවන යම් නාමයෝජනා පත්‍රයක්, ප්‍රතික්ෂේප කළ යුතු ය.".

ජ 72524—12,075 (83/10)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 ක. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.